## නුවරඑළිය මහා නගර සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන.

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 14 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 14 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 21 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය.

නගරාධිපතිවරයා වෙත යවන ලද 2012 සැප්තැම්බර් 21 දිනැති මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති නුවරඑළිය මහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

##### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). වටිනාකම රු.36,514,040 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 09 ක් මොටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කිරීම නිසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ). දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය මහා නගර සභාවේ බහුකාර්ය සමාජ සේවා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රදානය කරන ලද රු.30,”109”,955 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

##### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.177,000 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ). ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම.

එකතුව රු.464,919 ක් වූ ගෙවීම් වවුචර් 11 ක් 2012 ජූලි 29 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.65,478,234 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.61,677,541 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). | වරිපනම් හා බදු | 71,271 | 101,847 | 74,431 |
| (ii). | බදු කුලී | 15,209 | 6,932 | 37,855 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 9,855 | 9,855 | 4,851 |
| (iv). | වෙනත් ආදායම් | 55,795 | 44,067 | 13,746 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 111,777 |
| (ii) | මුද්දර ගාස්තු | 12,831,512 |

2.3 ආර්ථික නොවූ ගනුදෙනු.

එකතු කළ අගය මත බදු රහිතව රු. 362,791ක මාසික ගෙවීමක් මත සභාව විසින් පෞද්ගලික ආරක්ෂක සේවා සමාගමක් තෝරාගෙන 2011 මැයි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ එම සීමාව ඉක්මවා වූ රු.268,627 ක මුදලක් අදාළ සමාගමට වැඩිපුර ගෙවා තිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු.

විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව පරිගණක පුහුණු වැඩසටහනක් සඳහා උපදේශක ආයතනයක් වෙත රු.300,000 ක මුදලක් ගෙවා තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). ප්‍රමාණවත් ඇපකරයක් ලබා ගැනීමකින් තොරව රු.108,860 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා තොගයක් සභාවේ සෞඛ්‍ය ගබඩා අංගනය ඉදිකිරීමේ පෞද්ගලික කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණි.

(ආ). ග්‍රෙගරි වැව උද්‍යානය තුළ සංචාරකයින් සඳහා පා පැදි ධාවනයට යෙදවීම වෙනුවෙන් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් සහ විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2011 ජූලි 11 දින පවත්වන ලද සභාවේ දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන්ගේ රැස්වීමකදී ගනු ලැබූ තීරණයක් මත රැස්කරන ආදායමින් 75% ක බදුකරු වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂය තුළ දී රැස්කරන ලද මුදල රු.1,280,000 ක් වූ අතර බදුකරුට ගෙවා තිබූ මුදල රු. 960,000 ක් විය.

(ඇ). පසුගිය මැතිවරණයේදී නව සභාවට තේරී පත්නොවූ මන්ත්‍රීවරුන් 05 දෙනෙකුට ලබාදී තිබූ රු.115,000 ක් වටිනා ජංගම දුරකථන ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). සභාවේ මූල්‍යකරණය හා වත්කම් පරිහරණය සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කිරීමට කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනය සමඟ 2009 ජූලි 02 දින රු.2,205,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. මිලගණන් ඉදිරිපත් කරන ලද ආයතන 04 ක මිලගණන් විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 18 වන උපදේශනයට පටහැනිව සුරක්ෂණ ඇපකරයක් ලබාගැනීමෙන් තොරව 20% ක අත්තිකාරම් ලෙස රු.441,000 ක් ගෙවා තිබුණි. ඉදිවෙමින් පවතින නව මහා නගර සභා ගොඩනැගිලි සංකීර්ණයට පරිගණක පද්ධතිය යළි ස්ථාපිත කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය ඇගයීමකින් තොරව මිලගණන් කැඳවා තිබුණි.

2.6 කාර්යසාධනය

----------------
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය.
------------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන.
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය.

(ආ). ආදායම් පරිපාලනය.

(ඇ). අයවැය පාලනය

(ඈ). වාහන පාලනය.

(ඉ). කොන්ත්‍රාත් පාලනය.